## කවි කොළය

# නුග ගසට අරක්ගත් දේවතාවුන් වහන්සේ!

වයසට යන කාලේ - යම් සැපක් ඕන නේදෝ
යන අදහස කාගෙත් - සිත් සතන් හී තිබෙන්නේ
දහ අත ණය වීලා - මේ ඉඩම් 'පොජ්ජ' ගත්තේ
හිඳිනට සැනසිල්ලේ - ගේ පැලක් සාදවන්නයි

මෙම ඉඩමේ මැද්දේ - යෝධයෙක් මෙන් නැගී හුන්
නුග රුකකිය ඇත්තේ - නෑ වෙනත් ගස් කුඩා හෝ
පරිසරයම පාළු - හිස් තැනක් සේ පෙනෙන්නේ
එනමුදු දුර ඇතින් - එක් කුඩා පැල්පතක් වේ

එම පැලෙහි වසන්නා - වූ ගිමාරා නමැත්තී
බිරිඳට මගෙ ළංවී - කීය මේ වන් කතාවක්
"නුග රුකට අරක්ගත් දේවතාවෙක් සිටින්නේ
හවසට මේ පැත්තේ - ආවොතින් දැක්ක හැක්කේ"

"හෙණ පුපුරණ වැස්සේ - ඊයෙ රෑ මං බලද්දි
නුග රුක අග්ගිස්සේ - දේවතාවුන් වහන්සේ
මහ ලොකු ගිනි ජාලා - වක් මැදින් දිස්වුණානේ
බොහොම බලගතුයි ඔව් - ආයි ඒකේ දෙකක් නෑ"

"නුග රුක උදුරාලා - ගේ හදන්නයි හදන්නේ"
"එහෙමද? එහෙනම් දෙයි - යෝ එයින් කෝපවේවී"
"මොකද අපි කරන්නේ? - ඒ එසේ නම් ගිමාරෝ?"
"බහිරවයට පූජාවක් - කළොත් නම් අපූරුයි"

"රටටම ණය වීලා - බිම් කඩක් මේ ඇබිත්තං
මිලයට අරගත්තේ - පර්චසේ විස්ස ගානේ
මෙම ඉඩමට මාගේ - අයිතිවාසිකමක් යම්
තියෙනව ද ගිමාරෝ - දේවතාවාට ඔප්පු ?"

"කරගෙන තමුසේලා - දේවතාවා ප්‍රකෝප
බලමුකො ඔය ගේ කොයි - යම් කපේදි හදා දැයි"
පසු දිනම හවස් හී - යෝධ බුල්ඩෝසරේකින්
නුග ගස පෙරලන්නයි - උන්නෙ මං නං හිතාලා

එයට මග හරස් වී - ආපි නෝනා ගිමාරා
නුගරුක ඇත තාමත් - ඒ කුඩා වත්ත මැද්දේ
මගෙ ගෙය හැදුනෙත් නෑ - දේවතාවා ගහෙත් නෑ
එය සිදුවුණු තාලේ - කිව්වොතින් මෙන්න මේමයි

"තමුසෙලට එපා නම් - දේවතාවුන් වහන්සේ
මගෙ ගෙදරට ගෙන්නා - මං කරන්නම් වතාවත්"
පොඩියට අඹ ලෑලි - හට් එකක් වත්තෙ ඉන්දා
එයට වඩින සේකැයි - කන්නලව් ඈ කළා ය



එම දවසට පස්සේ -
දේවතාවුන් වහන්සේ
ඇයගෙ අර පකිස් පෙට් -
ටී විමානේට රිංගා
රටට සෙත සදයි මන් -
ත්‍රීවරුත් පෝලිමේලු
නැගණහිර පළාතෙන් -
පිල්ලෙයානුත් මෙහේ එයි

♦ තලන්ගම ජයසිංහ
Sri Lanka





සිළුමිණ වර්ෂ 1999 ක්වූ ජූලි 18 වැනිද ඉරිද

## ඇබෑර්තු

පොල් කැඩීම සඳහා වඳුරන් පුහුණු කිරීමට පළපුරුද්ද ඇති අය අයදුම් කරන්න.

දැනවීම්කරු,
85/8, ධවලසිංහාරාම මාවත, කොළඹ 15.

## දිවිනසාගන්න ඇවිත් පෙම්වතා පනිද්දි පෙම්වතිය දුවලා

*කුරුවිට සමූහ වාර්තා - රූපිකා කේ. බණ්ඩාර*

දිවිනසා ගැනීමට තීරණය කළ පෙම් යුවලක පෙම්වතා දිය ඇල්ලෙන් පහළට පනිද්දී පෙම්වතිය ආපසු හැරී දුවගොස් ඇත.

මෙසේ දිවිනසාගෙන ඇත්තේ හිඹුටාන පදිංචි 21 වියැති සමිත් චන්න පෙරේරා නමැත්තෙකි.

ඉකුත් 1 වෙනිදා කුරුවිට දොඩං ඇල්ල නැරඹීමට පැමිණි මේ පෙම්වතුන් යුවළ තම පෙම් සබඳතාවට දෙමාපියන් විරුද්ධවීම නිසා දිවිනසාගැනීමට තීරණය කළ බව මරණ පරීක්ෂණයේදි හෙළිවිය. ඇල්ල නරඹමින් සිටි පිරිස එම පුද්ගලයා ගොඩගෙන රත්නපුර රෝහලට ගෙන ගියද ඒ වනවිට ඔහු මියගොසිනි.

## පොල් ගෙඩිය ඇතුළේ බෝම්බ සඟවා ගෙනෙයි

වව්නියාව සහ හොරොව්පතාන අතර ධාවනය වන බස් රථයක් ගිය සතියේ වව්නියාවේ කැරකොප්පු හංදිය අසළ පිහිටුවා ඇති පොලිස් මුරපොළේ දී නවතා පරීක්ෂාවට භාජනය කළ අවස්ථාවේ බසයේ ආ එක් තරුණ ගැහැණියකගේ මල්ලක පොල්ගෙඩි වගයක් තිබී ඇත. ඒ පොල්ගෙඩි ද සැක කටයුතු ලෙස පෙනුණු නිසා පොලිස් නිලධාරියෙක් වැඩිදුරටත් ඒ ගැන සොයා බලද්දී ඒ පොල් ඇතුළේ පුපුරණ ද්‍රව්‍ය සඟවා ඇති බව පැහැදිලි විය. තවද එම කාන්තාව කොටි සාමාජිකාවක් බවද සොයාගෙන ඇත.

**ඉරිදා - SUN** සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාලද සිල්වා ලෝක සෞඛ්‍ය සංවිධානෙට යෝජනා කළාලු රෝග මර්දනයට බුදුදහම සහ භාවනා ක්‍රම පාවිච්චිකරන්න කියලා. යෝජනාව නරක නැහැ. ඒ වුනාට ලෝකෙ මිනිස්සු එයා කියන ඒවා පිළිපදීද? ඇයි ලෝකෙට කියන්න ඉස්සෙල්ලා ලංකාවෙ ඒක පටන්ගන්නෙ නැත්තෙ? ඊළඟ කාරණේ තමයි අපේ සෞඛ්‍ය ඇමති කණ්ණාඩියෙන් තමන්ගෙ ස්වරූපය දිහා බලනවද කියන එක සැකයි. ඒ තරම් මහත සෞඛ්‍ය ඇමති කෙනෙක් මුළු ලෝකෙ කිසිම රටක නැහැ. සම්මේලන වලට ගියාම රටවල්වල අනෙක් නියෝජිතයන්ට හිතෙනවා ඇති කියන්න මනුස්සයෝ සෞඛ්‍ය ඇමති වශයෙන් තමුසෙ ඇඟ ටිකක් අඩුකරගන්න බලනවා කියලා.එයා ආහාර ඇමතිකමේ වත් හිටියනම් කමක් නැහැයි කියන්න පුළුවන්.

**සඳුදා - MON** දැන් ලෝක මිනිස් අයිතිවාසිකම් සංවිධාන වලින් ලංකාවට බලකරනවා කොටි සංවිධානෙට මානුෂිකව සලකන්න කියලා. කන්න බොන්න දෙන්නලු. ලෙඩට දුකට බලන්නලු. වෙඩි තිබ්බත් නිකම් කකුලක් අතක් යාන්තම් හීරෙන්න වෙඩිතියනවා මිස මැරෙන්න වෙඩිතියන්න එපාලු. නිකම් බයකරන්න රතිඤ්ඤා කරලක් ඇහට විසිකරනවා මිසක, කොටි බංකර්වලට බෝම්බදාන්න එපාලු. ඔන්න ඔය වගේ ඉල්ලීම්. ඒකට ලංකා ජනාධිපතිවරයා හොඳ උත්තරයක් දීලා තිබුණා මෙහෙම. "කොටි කියන්නෙ අමුම අමු ත්‍රස්තවාදීන් කොටසක්. උන්ගෙ නමෙනුත්, උන් කරන දේවලිනුත් පේනව නේද උන් මනුස්සයො නෙවෙයි, තිරිසන්නුන්ටත් අන්ත තිරිසන්නු ජාතියක් බව. ත්‍රස්තවාදීන්ට කන්න බොන්න දෙන්නෙ කොයි ලෝකෙද? ඇත්තට තොපිට අමු කැවිලද?" අන්න එහෙම ඉන්න ජනාධිපතිතුමා.

**කුජදා - TUE** කිංස්ලි ලංකාවට යනකොට අපේ ගෙදර එයාගෙ කාර් එක දාලා ගියේ. පෙරේදා ආපහු ඇවිත් එදාම හවස ආවා කාර් එක ගෙනියන්න. ලංකාවෙ විස්තර වැඩිය කිව්වෙ නැහැ. අක්කට බැන්න කිංස්ලිගෙ ලොකු අක්ක ඉඩමක් පවුලෙ කාටවත් නොදී පිටට විකුණුවා කියලා. අපේ නිහාල් එයාට පහදලා දුන්නා ඇයි ලංකාවෙ මිනිස්සු තමන්ගෙ අයට ඉඩම් තියා කිසි දෙයක් විකුණන්නෙ නැත්තෙ කියලා. හේතුව තමන්ගෙ අය ඕනම දෙයක් ඉල්ලන්නෙ අන්තිම අඩුවට. දුන්නෙ නැතිවුනාම බනිනවා. සල්ලි දෙන්නෙ සැරින් සැරේ ටික ටික. අන්තිමට සල්ලි ගන්න පස්සෙන් යන්න ඕන. සේරම මුදල ලැබෙන්නෙත් නැහැ. කාලයක් ගිහිල්ලත් ආයිත් බනිනවා කුණුගොඩක් ඇහේ ගැහුව කියලා පිට මිනිස්සුන්ට දුන්නම ඒ ප්‍රශන නැහැ. ඕකයි හේතුව.

**බුදදා - WED** ලංකාවෙ මේ දවස්වල වැඩ වර්ජන. උපාධිධාරීන් අකුරට වැඩ කියලා ස්ට්‍රයික් එකක් පටන් අරන්. ඒ කියන්නෙ හෙමින් වැඩ කිරීම. වෙනද දවසින් කරන වැඩ දැන් සති තුනකින් ඉවරකරන්නෙ. විනාඩි පහෙන් පහට එළියට යනව තේ සිගරැට් බොන්න. ලන්ච් බ්‍රේක් එක වෙනදට පැය බාගෙ දැන් පැය දෙකක් කරල. හවස තුන වෙන කොට ගෙදර යනවලු. මේ සේරම කරන්නෙ ඒඅයගෙ පඩි වැඩි නොකළ නිසා ආණ්ඩුවට පාඩමක් උගන්වන්නලු. මම දන්න හැටියට ලංකාවෙ කවදත් වැඩ කෙරුණෙ ඒ විදියට තමයි. මට ඇන්ටන් ජෝන්ස්ගෙ පරණ බයිල සිංදුවක් මතක් වෙනවා. කන්තෝරුව... කන්තෝරුව... මම වැඩකරන.... එතන තමයි මාහට ඇති විනෝද උයන....හවස හතර වෙනතුරු මගෙ පාඩුවේ....කටු ගැණ ගැණ ඉන්නව ඔරලෝසුවේ.... ඒක තමයි දැන් එහේ වෙන්නෙ. අනේ අපේ ලංකාව!

**ගුරුදා - THU** ආතර් මාමගෙ ලියුමෙ තිබුණා, ලංකාවෙ රජය හරියට දොස් කියනවයි ස්ට්‍රයික් කාරයින්ට. රට මෙච්චර අනතුරු අවස්ථාවකට වැටිලා තියෙද්දී, යුද්ධයක් කරද්දී, බෝම්බ පිපිරෙද්දී, එහෙම අසාධාරණ ඉල්ලීම් වැරදිය කියලා. හැබැයි එහෙම කියන ගමන් රජය මැති ඇමතිවරුන්ට සද්ද නැතුව දහස් ගණනින් පඩි වැඩිකර ගන්නවා, ලක්ෂරි වාහන ගෙන්නලා දෙනවා, එහෙම කරන කොට රටේ ජනයා වැඩ වර්ජන කරන එක අහන්න දෙයක්ද? මේ ආණ්ඩුවට මොළයක් නෑ කියලා ආතර් මාම කියනවා. කතාව හරි ඇත්ත.

**කිව්දා - FRI** ලංකාවට කතාකරපු වෙලාවක සුවර්ණා නංගි කිව්වා, ලංකාවෙත් මැලේසියාවෙ වගේ වඳුරො ලවා පොල්කඩවන්න යනවයි කියලා. දැන් කිසිම මිනිහෙක් නැතිලු පොල් ගහකට යවන්න. සේරම මැද පෙරදිග වැඩට ගිහිං. මාත් හිතන්නෙ ඒක හොඳ අදහසක්. ඒ විදියට වඳුරො ලව්වා ලංකාවෙ පුරං වෙච්ච කුඹුරු ටිකත් අස්වද්ද ගත්ත නම් හොඳයි. මොකද දැන් මේ ලංකාවෙ ඉන්න ඉලන්දාරි වැඩි දෙනෙක් තඹ සතේක වැඩක් කරන්නෙ නැහැ, පිස්සු විකාර මිසක්. උන්ට ඇති වැඩකුත් නැහැ, රටට ඇති වැටකුත් නැහැ. ඔය විදියට යනකොට වඳුරො රජයේ සේවයටත් බන්ද ගනීවි. එතකොට ස්ට්‍රයික් නෑ. හැබැයි වෘත්තීය සමිතිකාරයෝ ටික වඳුරන්ට කිට්ටුවෙයි ද දන්නෙ නැහැ. එතකොට ලෙඩේ.

## මාධ්‍යවේදීන්ට පහර දෙති

පසුගියදා මැර ප්‍රහාරයකට ලක්වූ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ විෂයමාලා සම්බන්ධීකාරක නාමල් පෙරේරා මහතා සහ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයයේ දේශපාලන හා මාධ්‍ය භාර නිලධාරී මහේන්ද්‍ර රත්නවීර මහතාට පහර දුන් මැරයන් අත් අඩංගුවට ගන්නා ලෙස බල කරමින් ජූලි මස 02 දින දහවල් කොල්ලුපිටිය මංසන්ධියේ දී විරෝධතාවයක් පැවැත්විණ.

මාධ්‍ය සංවිධාන එකතුව සමග එක්වූ එක්සත් ජාතික පක්ෂය, මුස්ලිම් කොන්ග්‍රසය, වාමාංශික පෙරමුණ, ශ්‍රීලනිප මහජන පෙරමුණ සහ වෘත්තීය සමිති, බහුජන සංවිධාන රැසක පිරිස් මෙම උද්ඝෝෂනයට එක්ව සිටියහ. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාද මෙම උද්ඝෝෂණයට එක්ව සිටීම විශේෂත්වයකි.

සිනමා නළු රන්ජන් රාමනායක ද එම උද්ඝෝෂණ රැලියේ හඬ නැගූ අයුරු →

## කොළඹ විත්ති




## භික්ෂූන්ට කඳුළුගෑස් ප්‍රහාරයක්



කොළඹ ධර්මපාල වටරවුම අසල පාරේ වාඩිලා ගෙන උද්ඝෝෂණයේ නිරතවූ භික්ෂූන් වහන්සේලා පලවා හැරීම සඳහා කැරැලි මර්දන පොලීසිය එල්ල කළ කඳුළුගෑස් සහ බැටන් ප්‍රහාර හේතුවෙන් රෝගාතුර වූ භික්ෂූන් වහන්සේලා පස් නමක් කොළඹ ජාතික රෝහල්ගතව ප්‍රතිකාර ගැනීමෙන් පසු තුන්නමක් රෝහලෙන් පිටවගොස් ඇති බවත්, අන්තර් විශ්ව විද්‍යාලයීය භික්ෂු බල මණ්ඩලයේ කැඳවුම්කරු නාමල් ඔය ආනන්ද හිමියෝ පැවැසූහ.